# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.23 පැය 1540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 131 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


### ජීවිතාරක්ෂක තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය මඟින් සංවිධානය කරනු ලැබූ “73 වන ජාතික ජීවිතාරක්ෂක ශූරතාවලිය 2024” තරඟාවලිය 2025.01.17 සහ 18 යන දෙදින තුළ ශ්‍රීජයවධර්නපුර විශ්වවිද්‍යාලයේ පිහිණුම් තටාක සංකීණර්යේදී සහ ගල්කිස්ස මුහුදු වෙරළේදි පවත්වන ලදී.

මෙම ජීවිතාරක්ෂක තරඟාවලිය සඳහා ක්‍රීඩාසමාජ 14 ක් නියෝජනය කරමින් තරඟකරුවන් 210 දෙනෙකු සහභාගී වී ඇත. එහිදි ශ්‍රී ලංකා පොලිස් ජීවිතාරක්ෂක කණ්ඩායමේ ක්‍රීඩකයින් 15 දෙනෙකු එම තරඟාවලිය සඳහා සහභාගී වී රන් පදක්කම් 10, රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02 ක් දිනා ලකුණු 433 ක් ලබා ගනිමින් නව ජාතික වාතර්ා 02 ක් පිහිටුවමින් අඛණ්ඩව 13 වන වරටත් තරඟාවලියේ සමස්ථ ජාතික ශූරතාවය දිනාගෙන ශ්‍රී ලංකා පොලිසියට ඉමහත් කීතර්ියක් අත් කර දී ඇත.

පොලිස් ජීවිතාරක්ෂක කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති රොෂාන් විජේසිංහ මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සී.සී බමුණුආරච්චි මහතා , පුහුණුකරු ලෙස පොලිස් පරික්ෂක ජයවධර්න, කළමණාකරු ලෙස කාන්තා උප පොලිස් පරීක්ෂක ජේ.ඒ.එම් ජයසූරිය කණ්ඩායම් නායකයා ලෙස පොලිස් සැරයන් 40884 නෙරන්ජන් යන නිලධාරීන් කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**